---

ආරච්චිකට්ටුව **ප්‍රාදේශීය සභාව**

**පුත්තලම දිස්ත්‍රික්කය**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 23 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වරයාගේ වාර්තාව. 2013 ඔක්තෝබර් 31 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 **මතය**

මාගේ පරික්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව ආරච්චිකට්ටුව **ප්‍රාදේශීය** සභාවේ, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට ආරච්චිකට්ටුව **ප්‍රාදේශීය** සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) වර්ෂය තුල රු.81,339 කට මිලදී ගෙන තිබූ වත්කම් විෂයයන් 02 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) ආදායම් හා වියදම් උපචිත පදනම මත ගිණුම් ගත කර තිබුණද, ඉදිරි වර්ෂය සඳහා ලද වරිපනම් රු. 68,759 ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුලදී ඩබල් කැබ් රථයක් හා ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදී ගැනීමේදී ගෙවා තිබූ රු.857,169 ක එකතු කල අගය මත බදු (එ.අ.බ.) වටිනාකමද ඇතුලත්ව එම වත්කම් ප්‍රාග්ධනගත

කිරීම හේතුවෙන් එම වටිනාකමින් ස්ථාවර වත්කම් ගිණුම සහ ප්‍රාග්ධනයට ආදායමින්දායකවීමේ ගිණුම වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) 2010 වර්ෂය සඳහා ගිණුම්ගත කළ කල්පිත මුද්දර ගාස්තු වටිනාකම රු. 3,500,000 ක් වුවද, සමාලෝචිත වර්ෂයේදි 2010 වර්ෂය වෙනුවෙන් ලැබුණ මුද්දර ගාස්තු රු.4,777,078 ක් වුයෙන් ඌන ප්‍රතිපාදනය වු රු.1,277,078 ක් ණය ගැතියෝ සහ සමුච්චිත අරමුදල අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) වර්ෂය තුල ලැබු මූලධන ආධාර වටිනාකම රු. 1,844,896 ක් ආදායම් හා වියදම් ගිණුමට බැරකර නොතිබුණ අතර, මූලධන ආධාර ගිණුමේ බැර ශේෂය හිඟහිටි වෙනත් ආදායම් වලින් අඩුකොට මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. එම හේතුවෙන් මූලධන ආධාර වටිනාකම හා හිඟහිටි වෙනත් ආදායම් වටිනාකම රු.1,844,896 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

### 1.3.2 නොසැසඳු පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 5කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු.16,266,139 ක්වු අතර, අදාල උපයෝගී ලේඛන අනුව ශේෂය රු. 16,303,168 ක් වුයෙන් නොසැසඳු රු. 218,975 ක ඍණ හා රු.256,004 ක ධන ශේෂයක් විය.

### 1.3.3 ගෙවිය යුතු ගිණුම්

2012 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබු ගිණුම් ශේෂවල වටිනාකම රු.9,762,705 ක්වු අතර, වසරක 01 ක කාලයක් ඉක්මවා තිබු ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 4,469,293 ක් විය.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 33,162,508 ක්වු ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්ම වු ආදායම රු.1,548,161 ක් වු අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවු ආදායම රු.7,087,587 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සභාපති වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. ,000 | රු. ,000 | රු. ,000 |
| (i) | වරිපනම් හා බදු | 2,932 | 2,612 | (8,542) |
| (ii) | බදුකුලී | 2,319 | 1,925 | 5,990 |
| (iii) | වෙළඳ බලපත්‍ර | 925 | 827 | 32 |
| (iv) | වෙනත් ආදායම් | 27,713 | 69,289 | 14,412 |

**2.2.2 වරිපනම් බදු**

සමාලෝචිත වසර අවසානයට වරිපනම් ඒකක 1380 කට අදාල වසරක කාලයක් ඉක්මවා තිබූ හිඟ වරිපනම් බදු ප්‍රමාණය රු.5,680,341 ක් විය.

**2.2.3 බදු කුලී**

සභාව සතු සතිපොල හා අනෙකුත් දේපල වලින් දීර්ග කාලයක් තිස්සේ අයවිම් හිඟහිට තිබූ රු.4,145,904 ක බදු මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය තුලදි ද කටයුතු කර නොතිබුණි.

2.2.4 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 3,013,184 |
| මුද්දර ගාස්තු | 5,474,577 |

2.3 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්

ඇස්තමේන්තු පිරිවැය රු. 2,685,570 ක් වූ ආනවිලුන්දාව මාළු වෙළඳපල ඉදිකිරිම් සඳහා 2005 වර්ෂයේදී, රු.1,618,954 ක වියදමක් දරා ඇතත්, ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් ඉදිකිරීම් නිමකර නොතිබු අතර 2013 ජූලි මාසය දක්වා භාවිතයට නොගෙන නිෂ්කාර්යව තිබූ බව පරීක්ෂණනයේදී අනාවරණය විය.

2.4 අවිධිමත් **ගණුදෙනු**

(අ) ඩබල් කැබ් රථයක් මිලදී ගැනීම.

සමාලෝචිත වර්ෂය තුල දී සභා අරමුදලින් රු. 7,900,000 ක වියදමින් පුද්ගලික සමාගමකින් ඩබල් කැබ් රථයක් මිලදී ගෙන තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) වාර්ෂික අයවැය ලේඛනයෙන් ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා ගෙන නොතිබු අතර ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර නොතිබුණි.

(ii) මුළු වියදම වු රු. 7,900,000 ක් සභා අරමුදලින් දැරීම සඳහා මහා සභා අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(iii) රජයේ වියදම් පාලන කමිටුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) ඉන්ධන භාවිතය

සභාපති වරයාගේ නිල වාහනය සඳහා සභාව විසින් මසකට අදාල ඉන්ධන සීමාවන් පනවාගෙන නොතිබීම හේතුවෙන් 2012 අගෝස්තු සිට නොවැම්බර් දක්වා වු මාස 04 ක් වෙනුවෙන් ඉන්ධන ලීටර් 3259 ක් සඳහා රු. 401,144 ක වියදමක් දරා තිබුණි.

---

3. **පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය